---

ගල්ගමුව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 12 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 අගෝස්තු 30 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට ගල්ගමුව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂනය කරනු ලැබේ.

(අ). ඉකුත් වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් යටතේ සමුච්චිත අරමුදල බැරකල යුතු රු.27,134,156 ක් ප්‍රාග්ධන වැය ගිණුම බැර කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වැය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ). සභාව විසින් විශ්‍රාම වැටුප් දායක අරමුදලට ගෙවිය යුතු රු.2,034,678 ක් ණය හිමියන් යටතේ හා සමාලෝචිත වර්ෂයට අදාලව ගෙවිය යුතු රු.91,888 ක් ආදායම් හා වියදම් ගිණුම යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). මෝටර් ග්‍රේඩර් ආදායම් වියදම් ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ ණයගැති වටිනාකම රු.2,558,791 ක් වුවද, එය රු.3,172,694 ක් ලෙස ගිණුම් ගතකිරීම හේතුවෙන් මෝටර් ග්‍රේඩර් ගිණුමේ ලාභය රු.613,903 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණි.

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,123,896 ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.31,503,440 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,215,518 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,138 | 912 | 514 |
| (ii) | බදුකුලී | 6,013 | 6,994 | 1,278 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,521 | 1,382 | 139 |
| (iv) | වෙනත් ආදායම් | 12,830 | 72,557 | 5,575 |

2.2.2 වරිපනම් බදු

වාර්ෂික බිල් කිරීම් රු.1,145,052 ක් වූ රු.514,153 ක හිඟ බදු සම්බන්ධව 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 හා 159 වගන්ති හා 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 33 සිට 42 විධිවිධාන පරිදි ගෙවීම් පැහැර හරින පුද්ගලයන් පිළිබඳව හිඟ ලැයිස්තු හා අවසන් නිවේදන පිළියෙල කර දේපල තහනම් කිරීමේ ක්‍රියාවලිය සිදුකර නොතිබුණි.

2.2.3 බදුකුලී

පහත කරුණු නිරීක්ෂණය කරන ලැබේ.

(අ). සභාවට අයත් මෝටර් ග්‍රේඩරය කුලියට දීම වෙනුවෙන් 2009-2012 කාලයට අදාලව රු.3,172,694 ක මුදලක්ද, බැකෝ යන්ත්‍රය කුලියට දීම වෙනුවෙන් 2011 හා 2012 කාලයට අදාල රු.2,696,351 ක මුදලක්ද, තලන රෝල කුලියට දීම වෙනුවෙන් 2011 හා 2012 කාලයට අදාලව රු.1,295,731 ක මුදලක්ද

සමාලෝචිත වර්ෂය අවසානය වන විට හිඟව පැවතුණි. අදාල පාර්ශවයන් සමඟ විධිමත් ගිවිසුම් වලට එළඹ නොතිබීම හේතුවෙන් මෙකී මුදල් අයකර ගැනීම ගැටළුකාරී වී තිබුණි.

(ආ). සභාව සතු දේපල 13 ක් අතුරින් අවම ලංසුව වූ රු.254,472 ක් වූ දේපල 3 ක් සමාලෝචිත වර්ෂයට අදාලව බදුදීමට නොහැකි වී තිබුණි. 1988 ප්‍රාදේශීය සභා (මුල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති අංක 76 විධිවිධාන ප්‍රකාරව බදු ලේඛණය කමානුකූලව නඩත්තු කර නොතිබූ අතර අදාල තොරතුරු නිසි පරිදි සම්පූර්ණ කර තුලනය කර නොතිබුණි.

(ඇ). වාර්ෂික දේපල බදුදීම් යටතේ 1994 වර්ෂයට අදාලව රු.48,715 ක් ද 2009 වර්ෂයට අදාලව රු.16,755 ක් ද 2011 වර්ෂයට අදාලව රු.449,866 ක්ද 2012 වර්ෂයට අදාලව රු.306,490 ක්ද සමාලෝචිත වර්ෂය අවසානය වන විට අයකර ගැනීමට පැවතුණි.

(ඈ). ගල්ගමුව පොදු වෙළඳපල කඩ කාමර බදුදීම් යටතේ එකවර ගෙවන මුදල් වාරික ගෙවීම් දුර්වල මට්ටමක පැවති අතර සමාලෝචිත වර්ෂය අවසානය වන විට කඩ කාමර 29 කට අදාලව රු.2,035,579 ක මුදලක් අයවීමට තිබුණි.

(ඉ). අවම ලංසුව රු.9,193,154 ක් වූ කඩ කාමර 12 ක් එකවර ගෙවන ක්‍රමයට බදුදීම සඳහා ටෙන්ඩර් කර තිබුණි. 2012 මැයි අවසාන වන විටද ගිවිසුම් ගතව පැවතියේ අවම ලංසු එකතුව රු.1,896,118 ක් වූ කඩ 3 ක් පමණි. අවම ලංසු එකතුව රු.5,810,630 ක් වූ කඩ කාමර 7 ක සම්බන්ධයෙන් ගිවිසුම් වලට එළඹ නොතිබුණි.

2.2.4 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර බිල් කිරීම් වලට අදාලව 1988 ප්‍රාදේශීය සභා( මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ රීති 59 හා 67 දක්වා ඇති විධිවිධාන පරිදි වූ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.

2.2.5 <u>දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට සභා බල ප්‍රදේශය තුල පිහිටුවා ඇති දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සංඛ්‍යාව 05 ක් වූ අතර, පෙරසැරි ගාස්තු වලට අමතරව මෙකී කුළුණු වෙනුවෙන් ඉකුත් වර්ෂයේ පිරිවැටුම මත 1% කට නොවැඩි මුදලක් අයකරගත හැකි වුවද, රු.3,000 බැගින් වූ බලපත්‍ර ගාස්තු පමණක් අයකර තිබණි.

2.2.6 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ හා මුද්දර ගාස්තු හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.2.7 <u>බස්නැවතුම්පල රථගාල් ගාස්තු අයකිරීම.</u>

ගල්ගමුව බස්නැවතුම්පල රථ ගාල් ගාස්තු අයකිරීම 2012 වර්ෂය දක්වා විධිමත්ව නොතිබූ අතර, 2012 සැප්තැම්බර් සිට ආදායම මත 40% කොමිස් ගෙවීමේ පදනමට පුද්ගලයකු බඳවාගෙන මාසිකව රු.43,960 ත් රු.217,000 ත්, අතර පරාසයක කොමිස් ගෙවා තිබුණි. දෛනික මුදල් බැදීම් හා මාසිකව එකතුවන මුදල් පිළිබඳව වෙනත් නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්වන බවක් හඳුනාගත නොහැකි ව අතර බස්රථ සඳහා කුලී ගාස්තු අයකිරීමට පත්කල පුද්ගලයාට සභාව විසින් ලබාදුන් අවසර පත්‍රයෙහි සඳහන් පරිදි සෑම දිනකටම පසු දින මුදල් සභාවට බැඳිය යුතු බව දැක්වුවත් සභාවට මුදල් බැදීමේ දින 5-10 අතර ප්‍රමාදයක් පැවතුණි.

2.3 නිෂ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

(අ). සභාව සතු රු.100,000 ක් පමණ වටිනා මිනි කුබෝටා ට්‍රැක්ටරයක් වර්ෂ 05 ක පමණ කාලයක සිටද, රු.1,250,000 ක් පමණ වටිනා කැබ් රථය වර්ෂයක පමණ කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ). රු.220,000 ක් වියදමින් ඉදිකරන ලද මීගලෑව පැරණි සතිපොල ගොඩනැගිල්ල හා රු.150,000 ක් පිරිවැය වූ මීගලෑව සතිපොල ගොඩනැගිල්ල සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ වලදී කිසිදු කාර්යයකට නොයොදවා නිෂ්කාර්යව පැවති අතර, වර්තමානය වන විට මීගලෑව සතිපොල ක්‍රීඩාපිටියේ පවත්වනු ලබමින් පැවතුණි.

2.4 වත්කම් කළමනාකරණය

භෞතික පරීක්ෂණ / සමීක්ෂණ මණ්ඩල වාර්තා මගින් තහවුරු නොව 2012 දෙසැම්බර් 31 දිනට පොත් අගය මත ගණන් බැලූ ඉඩම් හා ගොඩනැගිලි වල වටිනාකම රු.72,257,818 ක් විය.

2.5 සභාව විසින් ආරම්භ කර ඇති නෛතික කරුණු

මීගලෑව නගරයේ මහවැලි නගර මාර්ගයට මුහුණලා සභාවට අයත් ඉඩම් කට්ටි 05 ක අනවසර පුද්ගලයන් පදිංචිව ඇති අතර, මෙම අනවසර ගොඩනැගිලි ඉවත් කිරීම සම්බන්ධව 2009 වර්ෂයේ සිට නඩු අංක 9233 යටතේ නඩු පවරා ඇතත් සමාලෝචි වර්ෂය වන විටත් එය නිරවුල් වී නොතිබුණි.

2.6 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). ආසියානු සංවර්ධන බැංකු ණය ආධාර යටතේ රු.42,895,582 ක් වැයකර ගල්ගමුව නගරයේ ඉදිකර 2012 ජනවාරි 20 විවෘත කර තිබූ කඩ කාමර 36 කින් සමන්විත වෙළඳ සංකීර්ණය සඳහා සභාව විසින් ස්ථිර විදුලි සැපයුම් සේවාව සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම ලබාගෙන නොතිබුණි.

(ආ). ගල්ගමුව බස්නැවතුම්පල සංවර්ධනය කිරීම 1 අදියර ව්‍යාපෘතිය සඳහා රු.1,105,000 ක් වැයකර කුට්ටිගල් 34,000 ක් ලබාගෙන තිබුණද, අවසන් ද්‍රව්‍ය විශ්ලේෂණ වාර්තා අනුව කර්මාන්තය සඳහා භාවිතා කර තිබුනේ කුට්ටිගල් 22,200 ක් විය. අවශ්‍යතාවය ඉක්මවා කුට්ටිගල් 11,800 ක්

ලබාගැනීමට හේතු අනාවරණය නොවුණි. ඉතිරි වූ කුට්ටි ගල් 11,800 න් කුට්ටි ගල් 6486 ක් බස්නැවතුම්පල සංවර්ධනය කිරීමේ II අදියර සඳහා අදාල කොන්ත්‍රාත්කාර සමිතිය වෙත 2012 ජූනි මාසයේ ලබාදී තිබූ අතර, තවදුරටත් රු.172,705 ක් වටිනා කුට්ටි ගල් 5314 ක් ඉතිරිව පැවතිය යුතු වුවද, 2013 පෙබරවාරි 27 දින කරන ලද ස්ථානීය පරීක්ෂණයේදී එවැනි කුට්ටි ගල් තොගයක් ඉදිරිපත් නොවුණි.

2.7 <u>මෙහෙයුම් අකාර්යක්ෂමතා</u>

(අ). සභාව විසින් සංයුක්ත සැලැස්මක් පිළියෙල කර අනුමත කරගෙන නොතිබුණි.

(ආ). පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…2,034,678 ක්ව තිබණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු…7,657 බැගින් එකී අරමුදල විසන් අයකර පැවතයද, එකී අයකිරීම් සභාවේ කුමන සෙවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය